# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2497/44 – 2026 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා – 2026.07.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/262.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.02.13 දිනැති හා අංක 2423/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.01.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නාලන්ද, හුංගන්වෙල, වම්බටු යාය පදිංචි පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 04/2025 හා 2026.05.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 ජුනි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 047227– 10 (2026/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේදීය**

පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මයා,
වම්බටුයාය, හුංගන්වෙල,
නාලන්ද.

නඩු අංකය - A/04/2025
ගොනු අංකය - IR/COM/02/2018/262

*පළමු පාර්ශ්වය*

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

පවතින කාර්මික ආරාවුල

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මාතලේ කලුදැවල ප්‍රාදේශීය වැඩපළේ සේවය කළ පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මහතාට 2008.10.13 වන දින සිට 2015.03.07 වන දින දක්වා වැඩ තහනම් කර සිටි කාලසීමාවට අදාළව වැටුප් නොගෙවීම මඟින් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

මෙම ආරාවුල බේරුම්කරණය කිරීමට මා වෙත යොමු කිරීමට ප්‍රථම පූර්වගාමී බේරුම්කරුවන් දෙදෙනෙකු ඉදිරියේ අංක ඒ/20/2020 සහ ඒ/23/2021 කැඳවා ඒ/23/2021 යටතේ විමසීමට ආරම්භ කර ඇත.

ඒ අනුව පූර්වගාමී බේරුම්කාර නිමල් අබේසිංහ මහතා ඉදිරියේ ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි මෙහෙයවා ඔහුගෙන් හරස් ප්‍රශ්න හා නැවත ප්‍රශ්න අවසන් කර X-1 සිට X-5 දක්වා ලේඛන ද ලකුණු කරමින් ඉල්ලුම්කරුගේ සාක්ෂිය අවසන් කර ඇත.

බේරුම්කාර නිමල් අබේසිංහ මහතා ඉල්ලා අස්වීමේ හේතුව මත ඒ/04/2025 යටතේ මා වෙත විමසීම සඳහා යොමුකර ඇත.

මෙහිදී මා ඉදිරියේ ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ කමල් අමරසිංහ මහතාගේ උපදෙස් මත නීතිඥ දේවිකා දමයන්ති මහත්මිය ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරි දිමුතු පනංගල මහත්මිය ද පෙනී සිටි අතර මෙම බේරුම්කරණයේ පූර්වගාමී බේරුම්කරු විසින් නවතා තැබූ තැන සිට මෙම බේරුම්කරණය විමසීම ආරම්භ කිරීමට දෙපාර්ශ්වය එකඟ බව ප්‍රකාශ කරන ලදී.

2025.06.16 වන දින මා ඉදිරිපිටදී විමසීම ආරම්භ කරන ලද අවස්ථාවේ පළමුවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ කමල් අමරසිංහ මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ සප්රම් රාසික් මෙනෙවිය දඹුල්ල ඩිපෝ පරීක්ෂක එච්. එම්. ජේ. බී. ජයලත් මහතා සමඟ පෙනී සිටින ලදී.

මෙය විමසීමට ගන්නා ලද අවස්ථාවේදී සමථයක් තිබේදැයි ඇසූ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කරුණු සළකා බලා සමථයක් ඇතිවුවහොත් එය බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන බවත්, දෙපාර්ශ්වය සඳහන් කරන ලදී.

ඉල්ලුම්කරුගේ සාක්ෂිය මෙහෙයවා ඇති අතර ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ මහේස්ත්‍රාත් අධිකරණයේ ඔහුට එරෙහිව ඇති නඩුව හේතුවෙන් ඔහුගේ සේවය 2008 වර්ෂයේදී අත්හිටවූ බවත්, පසුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවෙන් පැමිණිලිකරුව නිදොස්කොට නිදහස් කළ බවත්ය.

ඉන්පසු ඉල්ලුම්කරු විසින් නැවත ඔහුගේ රැකියාව ලබාදෙන ලෙස නොයෙකුත් පාර්ශ්වයන්ට ලිපි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරුහට නැවත රැකියාව ලබාදුන් බවත්, එසේ රැකියාව ලබාදෙන විට ඉල්ලුම්කරු වෙත ලබාදුන් රාජකාරි ලිපිය බේරුම්කරණයේදී “X-1” ලෙසට ඉදිරිපත් කර ඇත. එකී ලේඛනය මගින් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ ඔහු “සියළු චෝදනාවලින් නිදහස් කර සේවා බණ්ඩනයකින් තොරව ඔහුට පෙර සිටි සේවය ලබා දී ඇති බවකි.”

මෙම “X-1” ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති 2015.03.12 දිනැති ලේඛනයේ සඳහන් වන්නේ “ඉල්ලුම්කරු සියළු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කර ඇති බැවින් ඉල්ලුම්කරුට පසු වැටුප් රහිතව සේවා බණ්ඩනයකින් තොරව පෙර සිටි සේවා තත්ත්වයේම 2015.03.17 වන දින සිට නැවත සේවය ප්‍රතිශ්ඨාපනය කරන ලද බවයි.”

එසේ ඉල්ලුම්කරුව නැවත සේවයේ ප්‍රතිශ්ඨාපනය කිරීමෙන් අනතුරුව ඔහු විසින් නැවත රැකියාවට ගොස් ඇති අතර ඉල්ලුම්කරු විසින් “X-1” සිට “X-4” දක්වා ලේඛන ඉදිරිපත් කරමින් බේරුම්කරණයෙන් ඉල්ලා සිටින්නේ, ඔහුගේ සේවය අත්හිටවූ කාලය වන අවුරුදු 06 යි මාස 05 ක කාලය සඳහා හිඟ වැටුප් ලබාදෙන ලෙස මූලික සාක්ෂි ලබා දී ඇත.

ඉන්පසු ඉල්ලුම්කරුගෙන් දෙවන පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න විමසන ලදී. එහිදී හරස් ප්‍රශ්නවලට පිළිතුරු ලබාදෙමින් ඉල්ලුම්කරු 2001 වර්ෂයේදී ගමනාගමන මණ්ඩලයට බැඳුනු බවත්, පසුව ඔහුට විරුද්ධව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර විනය පරීක්ෂණයක් සිදුකර විනය නියෝගය ලෙසට සේවයෙන් පහකර නියෝගයක් ලබා දී ඇති බවද, පසුව ඉල්ලුම්කරු ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර ඇති නමුත් අභියාචනයෙන් ද ඉහත කී විනය නියෝගය ස්ථිර කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් පිළිවෙලින් “R-1” “R-2” සහ “R-3” යන ලේඛන ඉල්ලුම්කරුට දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ප්‍රශ්න කිරීමේදී ඉහත කී කරුණු ඉල්ලුම්කරු විසින් පිළිගෙන ඇත.

එසේ ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු විසින් “X-1” ලෙසට ඉදිරිපත් කරන ලද 2015.03.12 වන දින දරන ලේඛනය දෙවන පාර්ශ්වය විසින් “R-4” ලෙසට ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරුව නැවත සේවයේ ප්‍රතිශ්ඨාපනය කර ඇති බවට පිළිගන්නා ලදී.

එසේම ඉහත කී “R-4” ලිපියේ නැවත සේවයේ ප්‍රතිශ්ඨාපනය කර පසු පඩි ලබාදීමක් සිදු නොකරන බවත්, සඳහන් කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරු 2015.03.14 වන දින සිට “R-4” ලේඛනයේ සඳහන් කොන්දේසි යටතේ සේවය කර 2017.09.16 වන දින ඉල්ලුම්කරු ස්ව කැමැත්තෙන් විශ්‍රාම ගෙන ඇත. එසේ ස්ව කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ ලිපිය දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු මාර්ගයෙන් “R-5” ලෙසට ලකුණුකොට ඉදිරිපත්කොට හරස් ප්‍රශ්න විමසීම අවසන්කොට ඇත.

ඉල්ලුම්කරු විසින් වෙනත් කිසිදු සාක්ෂිකරුවකු නොකැඳවන බවත්, ඉදිරිපත් කර ඇති “X-1” සිට “X-5” දක්වා ලේඛන ලකුණු කරමින් ඔහුගේ සාක්ෂි අවසන් ඇත.

ඉන්පසු දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි කැඳවන ලදී. මෙහිදී පළමුව ඩී. එස්. තුඩුගල සාක්ෂිකරුවකු ලෙස දෙවන පාර්ශ්වය කැඳවන ලද අතර, ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබුවේ “R-4” ලේඛනයේ සඳහන් පරිදි ඉල්ලුම්කරුට පසු වැටුප් රහිතව සේවා බණ්ඩනයකින් තොරව පෙර සිටි සේවා තත්ත්වයේම 2015.03.17 වන දින සිට නැවත සේවයේ ප්‍රතිශ්ඨාපනය කළ බවයි. එසේම “R-6” ලේඛනය මගින් ඉල්ලුම්කරු විසින් “R-4” ලේඛනයේ කරුණු පිළිගෙන කළුදැවල ප්‍රාදේශීය වැඩපළ වෙත සේවයට වාර්තා කර ඇති බවත්, ඉන්පසු 2015.03.18 වන දින ඉල්ලුම්කරු විසින් ලිපියක් ඉදිරිපත් කරමින් සේවයට වාර්තාකළ දිනට පසු දිනම ස්ථාන මාරුවක් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර දඹුල්ල ඩිපෝව වෙත ස්ථාන මාරුව ලබාගෙන ඇති බව “R-4” දරන ලේඛනය ඉදිරිපත් කරමින් ද, 2015.03.23 වන දින දාතම සහිත ලිපිය මගින් දඹුල්ල ඩිපෝවට සේවයට වාර්තා කර ඇති “R-8” දරන ලිපිය ඉදිරිපත් කරමින් සාක්ෂි ලබාදෙන ලදී. එසේම 2017.09.29 වන දින ඉල්ලුම්කරු සිය කැමැත්තෙන් දඹුල්ල ඩිපෝවෙන් විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් ලිපිය “R-9” ලෙසට ඉදිරිපත් කර ඇත. පසුව මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න හා නැවත ප්‍රශ්න විමසීමෙන් අනතුරුව දෙවන සාක්ෂිකාරිය ලෙස සහකාර කළමනාකාර මුදල් තුෂානි සාගරිකා රාජපක්ෂ සාක්ෂිය සඳහා කැඳවන ලදී. ඇය ඉල්ලුම්කරු හඳුනන බවත්, ඔහු සේවය කළ අවුරුදු 17 සඳහා සේවයෙන් ඉවත් කළ කාලය සම්බන්ධයෙන් පසු පඩි හැර අනෙක් සියළුම ගෙවීම් ලබා දී ඇති බවට සාක්ෂි ලබා දී ඇත.

මෙහිදී ඉල්ලුම්කරුට ගෙවා ඇති සම්පූර්ණ පාරිතෝෂිත මුදල සම්බන්ධයෙන් ඇති සටහන සහිත ලේඛනය “R-10” ලෙසත් ඉල්ලුම්කරුට හිමි පාරිතෝෂිත මුදල “R-10A” ලෙසට ලකුණු කර ඉදිරිපත් කරමින් සාක්ෂි ලබා දී ඇත. එසේම සිය කැමැත්තෙන් විශ්‍රාම යෑම වෙනුවෙන් වන්දි ගෙවීම යන ලිපිය සහ එකී ලිපියේ අන්තර්ගත ඉල්ලුම්කරුට හිමි වන්දි මුදල සඳහන් සටහන පිළිවෙලින් “R-11” හා “R-11A” සහ ඉල්ලුම්කරු ලබාගත් සම්පූර්ණ වන්දි මුදල එනම් (පාරිතෝෂිත සහ වන්දි මුදල) සඳහන් ලේඛනය සහ ඉල්ලුම්කරුට ලබා දී ඇති මුළු මුදල පිළිවෙලින් “R-12” හා “R-12A” ලෙසට ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඉන්පසු දෙපාර්ශ්වයම විනය පරීක්ෂණය සම්බන්ධයෙන් සාක්ෂි කැඳවීම අවශ්‍ය නැති බව පිළිගනිමින් සාක්ෂි විමසීම අවසන් පසුව දෙපාර්ශ්වය විසින්ම ලිඛිත දේශනය ඉදිරිපත් කර ඇත.

**ප්‍රදානය**

ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයෙකුව සිටි බවත් ඔහු එම ආයතනයේ භාණ්ඩ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඔහුගේ සේවය අත්හිටවූ බව ද ඊට සමගාමීව විනය පරීක්ෂණයක් පවත්වා සේවයෙන් පහකළ බවත් එයට එරෙහිව ඉල්ලුම්කරු අභියාචනයක් ඉදිරිපත් කළ ද එය ද නිෂ්ප්‍රභා වූ බවත්, පසුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලුම්කරුව නිදොස්කොට නිදහස් වූ අතර, ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත නැවත පසු පඩි නොගෙවීමේ කොන්දේසියකට යටත්ව සේවය ප්‍රතිෂ්ඨාපනය කළ බවත්ය.

ඉන්පසු ඔහු සේවයට වාර්තාකොට පසුව 2017 වර්ෂයේදී සිය කැමැත්තෙන් ඔහුට හිමිවිය යුතු වරප්‍රසාද එනම් (පාරිතෝෂිත වන්දි) මුදල් ලබාගෙන සිය කැමැත්තෙන් විශ්‍රාම ගොස් ඇති අතර, වැඩ තහනම් කර තිබූ කාලයට නියමිත හිඟ වැටුප් නොලැබීම සම්බන්ධයෙන් බේරුම්කරණය ඉදිරියට පැමිණ ඇත.

මෙසේ සේවය ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවේ පසු පඩි නොගෙවීම් කොන්දේසිය පනවා ඇත්තේ කුමන හේතුවක් මත ද යන්න පළමුව විමසා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර කම්කරු සබඳතා තනතුර දරන දයාන් සේනක තුඩුගල යන අයගෙන් පළමු පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න විමසීමේදී,

ප්‍ර: ඒ අනුව ඔහුගේ විනය නියෝගයේ යම්කිසි තැනක සඳහන් කරනවා ද මොහුට වැටුප් ගෙවන්න එපා කියලා?
පි: ඔව්. විනය නියෝගයේ සඳහන් කරලා තිබෙනවා.
ප්‍ර: කොහේද සඳහන් කරලා තිබෙන්නේ?
පි: අංක ශ්‍රී ලංගම/ප්‍රා කා/මනු/වි/IV/2008/585 – 2009.01.09 දිනැති විනය නියෝගයේ සේවය තහනම් අවධියේ නොගෙවන ලද වේතන අහිමි කර දඬුවමක් වශයෙන් සේවයෙන් පහ කිරීමට නියෝග කරමි.
ප්‍ර: ඒ විනය නියෝගය දීලා තිබුනට පස්සේ තමයි මේ මහේස්ත්‍රාත් අධිකරණ නඩුව ක්‍රියාත්මක වුනේ?
පි: ඔව්.
ප්‍ර: ඊටපස්සේ මෙම මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය සළකලා බලලා තමයි එම විනය නියෝගයෙන් කොටසක් ඉවත් කරමින් මෙම තැනැත්තාව නැවත සේවයේ පිහිටෙව්වේ?
පි: ඔව්.
ප්‍ර: ඒ අනුව කොටසක් ඉවත් කිරීමට විතරක් හේතුවුණු විශේෂ කාරණයක් සඳහන් වෙනවාද?
පි: මේ සම්බන්ධයෙන් ආයතනික පරීක්ෂණයක් කරලා තිබෙනවා විමර්ශනයක්. ඒ අනුව විනය විභාග පවත්වලා තියෙනවා. විනය විභාගවලදී ඉදිරිපත් වුන වැඩි බර සාක්ෂි අනුව ඉල්ලුම්කරු වරදකරු බවට පත්වෙලා තිබෙනවා. නමුත් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීන්දුව සැළකිල්ලට අරගෙන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ඉල්ලුම්කරුට සේවයේ අඛණ්ඩතාවය පිළිඅරගනිමින් නැවත සේවයේ පිහිටුවා තිබෙනවා පසු වැටුප් රහිතව.
ප්‍ර: එහෙම පසු වැටුප් නවත්වන්න හේතුවක් කියලා තිබෙනවාද?
පි: විනය නියෝගයේ තිබෙනවානේ පසු වැටුප් රහිතව කියලා
ප්‍ර: ඊටපසුව විනය නියෝගය ආපසු හැරවීමක් නේ නැවත සේවයේ පිහිටුවීම?
පි: නැවත සේවයේ පිහිටුවන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසිම අවස්ථාවක පසු වැටුප් ලබාදීමක් සිදුකරනු ලබන්නේ නැහැ.
ප්‍ර: එහෙම පසු වැටුප් ලබාදීමක් සිදුකරන්නේ නැහැ කියලා තීරණයක් තිබෙන්නේ කොහේද?
පි: ඒක ආයතනික තීරණයක්. ඒ වගේම ඉල්ලුම්කරු ආයතනික පරීක්ෂණයෙන් වරදකරු වෙලා තිබෙනවා. ඒ වරදට දඬුවමක් විදිහට වේතනය අහිමි කිරීමක් සිදුකරලා තිබෙනවා. ඒ අනුව ආයතනය මොහුට සේවය ප්‍රතිෂ්ඨාපනය කර සේවයේ අඛණ්ඩතාවය පිළිඅරගනිමින් නැවත සේවය ලබාදී තිබෙනවා.

එසේම වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සහකාර කළමනාකාර මුදල් තුෂාරි සාගරිකා රාජපක්ෂ යන අයගේ සාක්ෂිවලින් ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරුව නැවත සේවයේ පිහිටුවන විට වැඩ තහනම් කර සහ සේවයෙන් පහකර සිටි කාලයට නියමිත පසු පඩි නොමැතිව නැවත රැකියාව ලබාදී ඇති බවත් ඔහු කැමැත්තෙන් විශ්‍රාම යන අවස්ථාවේ ඔහුව ඉහත කී පසු පඩි නොමැතිව අනෙකුත් සියළුම ලැබිය යුතු වරප්‍රසාද හිමිවූ බවත්ය.

නැවත සේවයේ පිහිටුවන විට කිසිම අවස්ථාවක ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පසු වැටුප් ලබා නොදෙන බවට ආයතනික තීරණයක් ඇති බව දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි ලබාදුන් අතර එය පළමු පාර්ශ්වය විසින් කිසිදු අවස්ථාවක අභියෝගයකට ලක්කර නොමැත.

ඉල්ලුම්කරුට 2008.10.13 දින සිට 2015.03.07 වන දින දක්වා වැඩ තහනම් කර නැවත 2015 දී ඔහුගේ රැකියාව ලබා දී ඇත. එසේ ලබාගන්නා අවස්ථාවේදී හෝ ඔහු සේවයෙන් විශ්‍රාම යවන අවස්ථාවේදී හෝ කිසිම අවස්ථාවක වැඩ තහනම් කර තිබූ කාලයේ පසු පඩි සම්බන්ධයෙන් ඉල්ලීමක් කර නොමැති බව පෙනී යන කරුණකි.

ඉල්ලුම්කරු විසින් ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ ඔහු රැකියාව අහිමිවේ යැයි යන බයට සහ ඔහු පසු පඩි ඉල්ලීමට නොහැකි වූයේ ඔහුට ඉහළ නිලධාරීන් බැන වැදුනු නිසා බවත්ය. නමුත් ඔහු බේරුම්කරණය ඉදිරියේ එසේ කියා සිටිය ද වෙනත් කිසිම අවස්ථාවකදී එවැන්නක් සඳහන් කර නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සිදුකර නොමැති බවත්, පෙනීයයි.

එසේම ඉල්ලුම්කරු විසින් 2018.09.29 කැමැත්තෙන් විශ්‍රාම යැමෙන් අනතුරුව ඉල්ලුම්කරු විසින් 2019.08.07 වන දින කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම්කරු කරන ලද ඉල්ලීම කම්කරු අධිකරණයට “X” ලෙසට ඉදිරිපත් කර ඇත.

දෙපාර්ශ්වයේම සියළුම සාක්ෂි හා ලේඛන සුපරීක්ෂාකාරව බැලීමේදී පෙනීයන කරුණ නම් ඉල්ලුම්කරු 2015 දී නැවත සේවයේ පිහිටුවූ දා සිට 2019.08.07 දින දාතම දරන ලිපිය ඉදිරිපත් කරන දින අතර කාලයේ කිසිදු අවස්ථාවක ඉල්ලුම්කරු විසින් පසු පඩිය ලබාදෙන ලෙස වගඋත්තරකාර සමාගමෙන් ඉල්ලීමක් කර නොමැත.

ඔහු විසින් එසේ ඉල්ලීමක් කරනු ලබන්නේ කැමැත්තෙන් විශ්‍රාම යාමෙනුත් අවුරුද්දක් පමණ කාලයක් යාමෙන් පසු බව පෙනීයයි.

ඉල්ලුම්කරුට ඔහු සේවය කළ කාලය තුළදී උද්ගතව තිබුන ප්‍රශ්නයක් මත නොගෙවූ වැටුප් සම්බන්ධයෙන් ඔහු විසින් නැවත සේවය පිහිටුවීමේදී හෝ කැමැත්තෙන් විශ්‍රාම යාමේදී හෝ කිසිදු අවස්ථාවක පසු පඩි ඉල්ලා නොමැත.

දෙවන පාර්ශ්වය විසින් ඔවුන්ගේ ලිඛිත දේශනවල කරුණු තුනක් යටතේ මූලික විරෝධතාවයන් ඉදිරිපත් කර ඇත. නමුත් ඔවුන් මෙම විමසීම ආරම්භ කරන අවස්ථාවේදී එකී විරෝධතාවයන් ගෙන නොමැති බව පෙනී යයි.

තවද ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇත්තේ ඔහුව සේවයෙන් පහකළ කාලය සඳහා ඔහුට හිමිවිය යුතු මුදල වන අතර ඔහු විශ්‍රාම යැමෙන් අනතුරුව එකී ඉල්ලීම සම්බන්ධයෙන් ඔහුට හිමිකමක් ඇති නමුත් ඉල්ලුම්කරු තමන් සේවයේ නැවත පිහිටුවීමේදී පසු පඩි නොගෙවීම යන කරුණ සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක විරෝධතාවයක් ඉදිරිපත් නොකර 2015.03.17 නැවත සේවය පිහිටුවා 2018.09.29 වන දින ඉල්ලුම්කරු කැමැත්තෙන් විශ්‍රාම යාමේදී අනෙකුත් සියළුම වරප්‍රසාදයන් ලබාගෙන 2019.08.07 වන දින කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කරන තෙක් කිසිදු ඉල්ලීමක් 2015 සිට කර නොමැති හේතුව මතත්, විශ්‍රාම යැමේදී අනෙකුත් වරප්‍රසාද ලබාගෙන සේවයෙන් ඉවත් වූ පසු මෙලෙස ඉල්ලීමට ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති බව මම තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ද ප්‍රකාශ කරමි.

**නීතිඥ ටී. සී. ජේ. පීරිස්,**
බේරුම්කරු.

2026 මැයි මස 22 වැනි දින,

EOG 07 – 0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.